ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - 2019
-----------------------------------------------------

## 1.1 මතය ව්‍යාචනය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා එලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු එකතු පිරිවැය රු. 328,475,190 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම වත්කම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කාර්යාල උපකරණ, ලී බඩු උපකරණ හා යන්ත්‍රෝපකරණ වල වටිනාකම ප්‍රත්‍යාගනනය කර, එම වටිනාකම් පොත්වලට ගැනීම සඳහා කටයුතු කර ගෙන යනු ලැබේ. එම කාර්යය හැකි ඉක්මනින් අවසන් කර නිවැරදි වටිනාකම් ගිණුම් වලට ඇතුලත් කිරීමටත් නැවත මෙම උපකරණ ක්ෂය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 15 ඡේදයට අනුව තොග අගය කළ යුත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට වුවද, ආයතනය විසින් අමතර කොටස් තොග අගය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කිරීමකින් තොරව රු. 7,183,211 ක් වූ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අමතර කොටස් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය වර්තමාන පිරිවැයට වඩා අඩු බව සඳහන් කරමි. කුඩා කොටස් විශාල ප්‍රමාණයකින් සමන්විත අමතර කොටස් වල වෙළඳපොල අගය තිරණය කිරීම අපහසු බැවින් එම වටිනාකම් ගිණුම් වලට ගැනීමට නොහැකි වී ඇත. භාවිතා නොවන අයිතම වැඩි ප්‍රමාණයක් පවතින හෙයින්ද එම කොටස් පිළිවෙත් අනුව ඉවත් කිරීමටත් ඉතිරි කොටස් තොගයේ වටිනාකම නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමටත් පියවර ගනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ එකතුව රු. 500,000 ක් වූ වාහනය හා පුහුණු උපකරණවල වටිනාකම වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් ලෙස හා ප්‍රාග්ධන සම්පාදන සංචිත යටතේ අනුචිත ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදි පරිත්‍යාග ලෙස ලද භාණ්ඩ එහි ඇතුලත් කර තිබීම දෝෂයකි.මෙම දෝෂය නිවැරදි කර ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) 2019 ඔක්තෝබර් 27 දින පෞද්ගලික ආයතනයක් විසින් වැල්ඩින් පුහුණු වැඩසටහන් සඳහා පරිත්‍යාග ලෙස ලබාදී තිබූ යන්ත්‍රයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාග කළ ආයතනයේද සහයෝගය ඇතුව මෙම යන්ත්‍රය සවිකිරිමේ කාර්යය සිදුකරමින් පවති. 2019 වර්ෂයේදී යන්ත්‍රය සම්පූර්ණ කර නොතිබූ බැවින් එහි වටිනාකම තක්සේරු කල නොහැකි වූ බැවින් ගිණුම් වලටද ගැනීමට නොහැකි විය. | ආයතනය භාවිතා කරන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2019 වර්ෂයට අදාල එකතුව රු. 566,302 ක් වූ උපචිත වියදම් අයිතම 19 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2020 වසර ගිණුම් පිළියෙල කිරීමේදී පෙර වර්ෂයේ ගැලපුම් ලෙස නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාල සියළු වියදම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) ආංශික නිපුණතා සංවර්ධන අරමුදල මගින් 2015 වර්ෂයේදී ඉදිකරන ලද රු. 129,578,570 ක් වටිනාකමැති ගොඩනැගිල්ල ගිණුම් වලින් අත්හැරී තිබුණි. | ආංශික නිපුණතා සංවර්ධන අරමුදල විසින් ඉදිකරන ලද විශ්වවිද්‍යාල විද්‍යායතන ගොඩනැගිල්ල ආයතනයේ පරිහරණය සඳහා 2015 වසරේදි ලබා දි ඇති බැවින් එහි වටිනාකම ගිණුම් වලට ඇතුලත් කිරීම සඳහා කටයුතු කරන බව සඳහන් කරමි. | ආයතනය සතු සියළු වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ජර්නල් වවුචර් | 478,528,464 | ජර්නල් වවුචර් 223 ක් | 2019 වසර සඳහා ජර්නල් පොතට අමතරව ජර්නල් වවුචර් ලිපි ගොනුවක් සකස් කිරීමට පියවර ගෙන තිබේ. එම ජර්නල් වවුචර් ලිපි ගොණුව මේ සමග ඉදිරිපත් කර තිබේ. | පිළියෙළ කරන ලද ජර්නල් වවුචර් සඳහා නිසි අනුමැතියක් ලබා ගත යුතුය. |
| ණය ගැති ණය හිමි ශේෂ | 14,999,141 | ණයගැති හා ණය හිමි ශේෂ සනාථ කිරීම් | ණය ගැතියන් සඳහා ශේෂ සනාත කිරීම් ලිපි යොමු කලද එම ආයතන වලින් පිළිතුරු ලබා දි නැත. | ශේෂ සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2019 දෙසැම්බර් 31 දිනට රු. 657,330 ක වටිනාකම වූ අඩමාණ ණය වෙන් කිරීමෙන් පසු එකතුව රු. 3,849,591 ක් වූ ණයගැති ශේෂයක් වූ අතර ඒ තුළ වර්ෂ 10 ට වඩා පැරණි ණයගැති ශේෂය රු. 886,702 ක් සහ වර්ෂ 5 ත් 10 ත් අතර ණයගැති ශේෂය රු. 993,160 ක් වූ අතර එම ණය අයකර ගැනීම අවිනිශ්චිතව පැවතියදී ඒ සඳහා අඩමාන ණය වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් වලින් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංගම බස් රථ අළුත් වැඩියාව සඳහා ශ්‍රී ලංගම ඩිපෝ වලින් අයවිය යුතු මුදල් වන අතර අයකර ගැනීමට නොහැකි ණය ශේෂ පාලක මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ගිණුම් පොත් වලින් ඉවත් කිරීමටත් අභ්‍යන්තර පාලනය විධිමත් කර දීර්ඝ කාලීනව හිග මුදල් පවත්වාගෙන යනු ලබන ඩිපෝවල බස්රථ අළුත්වැඩියාව තාවකාලිකව නවතා දැම්මටත් අවධානය යොමු වි ඇත. | ණය ගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, අයකර ගැනීම අවිනිශ්චිත ණය සම්බන්ධයෙන් අඩමාණ ණය ලෙස ප්‍රමාණවත් පරිදි වෙන්කිරීම් කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විෂය | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි756 | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්න දිනයක භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුව ද, ආයතනය විසින් විගණිත දිනය වූ 2020 ජුනි 03 දින තෙක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර 2018 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලය මගින් සිදුකරන ලද යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි. | 2019 වසර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සඳහා සමීක්ෂණ කමිටු පත්කර තිබේ. භෞතික සමීක්ෂණ 50% පමණ අවසන් කර ඇත. 2020 ජූලි මාසය අවසන් වීමට ප්‍රථම සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 1646 | වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආරම්භයේ සිටම ආයතනය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සතු අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ස්ථාවර තැන්පතු , කාලීන තැන්පතු හෝ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය නොකළ යුතු වුවත් ,එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් ස්ථාවර තැන්පතු ලෙස රු. 27,385,483 ක් ද , | ආයෝජන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කල නමුත් ඒ සඳහා පිළිතුරක් නොලැබුණි .මෙම ආයෝජන ආයතනයේ ඵලදායි කාර්යයන් සඳහා යොදවන ලෙසට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්ද උපදෙස් දී තිබේ. ඒ අනුව මේ වන විට ආයතනයේ සංවර්ධනය කල | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | භාණ්ඩාගාර බිල්පත් ලෙස රු. 11,803,478 ක් ද ආයෝජනය කර තිබුණි. | යුතු අංශ හඳුනාගෙන එම කාර්යයන් සිදු කිරීමට පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ආයතනය සතු වාහන 25 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 196,062 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 16,857,775 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 101 කින් හෙවත් රු. 17,053,837 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අර්ධ කාලීන පාඨමාලා ආදායම රු. 12,427,752 කින් අඩුවීම හා නිෂ්පාදන වියදම රු. 2,777,540 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය විසින් ප්‍රායෝගික පුහුණුව ලබාදීමේදී අදාළ අභ්‍යාසලාභීන්ගේ ආරක්ෂාව උදෙසා ශිෂ්‍ය රක්ෂණ ප්‍රතිලාභ අරමුදල මගින් අවශ්‍ය ආරක්ෂිත උපකරණ කට්ටල ලබාදීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් උපදෙස් ලබාදී තිබුණද 2020 ජනවාරි 31 දිනවන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම එම අභ්‍යාසලාභීන් පැළඳ සිටිය යුතු ආරක්ෂක පැලඳුම් කට්ටල මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි. | එක් වසරක දී බඳවාගනු ලබන ආධුනිකයින් 600 ක ප්‍රමාණයක් සඳහා අවුරුදු හතරක කාලයක් වෙනුවෙන් පැලැඳිය හැකි හොඳ තත්ත්වයේ ආරක්ෂක සපත්තු කට්ටලයක් ලබා දීම සඳහා රුපියල් 74,80,000 ක පමණ මුදලක් වැය වේ.<br><br>අදාල ආරක්ෂක උපකරණ නොපමාව සැපයීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. ආධුනිකයිනගේ ඇස් සේදීම සඳහා වන උපකරණයක් මිලදි ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවති. | ශිෂ්‍ය රක්ෂණ ප්‍රතිලාභ අරමුදල ශිෂ්‍යයින්ගේ ආරක්ෂාව සැපයීම වෙනුවෙන් යෙදවිය යුතුය. |
| (ආ) 2019 වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු. 500,000 ක් වෙන්කර තිබුණද ඉන් රු. 117,223 ක් එනම් සියයට 23 ක් උපයෝජනය කරමින් පොත් 197 ක් පමණක් මිලදී ගෙන තිබුණි. එසේම 2019 ජනවාරි 28 වන දින බොරැල්ල ශාඛාවෙන් පුස්තකාලය වෙත ලබාදුන් පොත් 416 ක් පරිශීලනයකින් තොරව පුස්තකාල පරිශ්‍රය තුළ ගොඩගසා තිබුණි. | පුස්තකාලය විසින් ප්‍රතිග්‍රහණය කිරීමට අපේක්ෂිත ග්‍රන්ථ දේශීය ප්‍රකාශන වෙළඳපොළ තුල නොතිබීම මත දීර්ඝ කාලීන ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් විජිතයාපා ප්‍රකාශන ආයතනය 2020.01.30 දින විදේශ වෙළඳපොළ තුලින් ප්‍රතිග්‍රහණය කිරීමට අපේක්ෂිත ග්‍රන්ථ මෙරටට ගෙන්වා දීමට කැමැත්ත පළකොට ඇත. මෙම ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.<br><br>ඇතැම් ග්‍රන්ථ පිළිසකර කොට ප්‍රතිසංස්කරණ සිදුකල යුතු ඒවා බැවින්, එම කටයුතු නිමවන තෙක් පුස්තකාල එකතුවට එක්කල නොහැකි මට්ටමේ පවතී. | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ පහත සඳහන් තීරණයන් 2020 ජනවාරි 31 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| I. 2016 හා 2017 වර්ෂ වල වාර්තා මාසයක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීම. | 2016 හා 2017 යන වර්ෂ වලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් පාර්ලිමේන්තුව රැස්වූ පසු එම වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව අමාත්‍යාංශය විසින් දන්වා ඇත. | වාර්ෂික වාර්තා නියමිත කාලය තුළ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |
| II. පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. | ලේඛකාධිකාරි,ප්‍රධාන ඉංජිනේරු (පුහුණු) , නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු -විෂයමාලා සංවර්ධන තනතුරු සඳහා අයදුම්පත් කැඳවුවද 2019 ජනාධිපතිවරණය කැඳවීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි විය. ආයතනීය පනතෙහි ප්‍රතිපාදන අනුව පාලන මණ්ඩල සාමාජිකයෙකු දැනට අධ්‍යක්ෂ විදුහල්පති වශයෙන් පත් කර ඇති අතර අදාල අනුමැතිය ලැබීමෙන් පසු බඳවා ගැනීමට අදාල දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>එසේම HM 1-1 හා HM 1-3 (නියෝජ්‍ය අධ්‍යක්ෂ-නියෝජ්‍ය විදුහල්පති) තනතුරු වලට බඳවා ගැනීම් පරිපාටියෙහි පවතින විෂමතාවයන් නිවැරදි කර දෙන ලෙසට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් කර ඇත. | බඳවා ගැනීමේ පරිපාටිය අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| III. ආයතනයේ සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීම. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ට අනුව සිදු කල සේවක අන්තර්ග්‍රහණයෙන් මතු වී ඇති තත්ත්වයන් කාර්මික සාමය ආරක්ෂා වන අයුරින් විසදා ගැනීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගෙන් උපදෙස් ඉල්ලා ඉල්ලීමක් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | තනතුරු ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඇතිවූ ගැටළුකාරී තත්ත්වයන් නිවැරදි කරගත යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජූනි 25 දින අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සිසුන් බඳවා ගැනීමේදී නිල ඇඳුම් ආයතනය විසින් සපයන බව ආයතනයේ | ආයතනයට බඳවා ගන්නා ආධුනිකයින්ගේ නිල ඇඳුම් එකම වර්ණයකින් සහ එකම ස්වරූපයකින් යුක්ත විය යුතු වුවද ඔවුන් බඳවා ගැනීමේ දී නිල ඇඳුම් සහ පොත්පත් | සිසුන්ගෙන් ලබාගන්නාවූ අරමුදල් ආයතනයේ |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ/විදුහල්පතිවරයා විසින් දන්වා තිබුණද නිල ඇඳුම් සඳහා රෙදි, පොත් සහ බෑගයක් නවක සිසුන්ට ලබාදීමේදී එක් ශිෂ්‍යයකුගෙන් රු. 3,800 ක් ආයතනයේ සුබ සාධක සංගමය විසින් අයකර තිබුණි. | වැනි ද්‍රව්‍ය එකම ආකාරයකට සහනශීලී මුදලකට ලබා දීමේ අරමුණින් මෙම කටයුත්ත සිදු කර ඇත. | ගිණුමට බැර කරගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව පෞද්ගලික ආයතනයක් මගින් පුහුණු උපකරණ 05 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී බදු සහිත වටිනාකම රු. 1,342,950 ක් බව සඳහන්ව තිබියදී ඒ සඳහා මුදල් ගෙවීමේදී නැවත බදු එකතු කර ගෙවීම් කර තිබීම හේතුවෙන් රු. 191,371 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පුහුණු උපකරණ මිලදී ගැනීමට අදාලව සැපයුම්කාර ආයතන විසින් VAT බදු රහිතව මිල ගණන් ඉදිරිපත් කර ඇත. එසේ හෙයින් VAT බදු ලෙස ගෙවා ඇති රු. 191,370.00 ක මුදල අදාළ සැපයුම්කාර ආයතනයෙන් ආපසු අයකර ගැනීමට අවශ්‍ය නොවන බව සඳහන් කරමි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**4.1 තිරසර සංවර්ධන අරමුණු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සිය සංවිධානයට අයත් සියළුම රටවල ආර්ථික සංවර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය "2030 - හඳුන්වා දී ඇති අතර ,එය සියළු සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කළ යුතු විශ්වීය ප්‍රකාශයක් වේ .ඒ අනුව ,ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් මෙම න්‍යාය පත්‍රයට අනුකූලව තම ආයතනයට ගැළපෙන අරමුණු 04 ක් හඳුනාගෙන තිබුණද එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ඉලක්ක, එම ඉලක්ක ළඟා කරගත යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | ගුණාත්මක අධ්‍යාපනය, යහපත් ක්‍රියාකාරකම් සහ ආර්ථික වර්ධනය හා අඩුකළ අසමානතාවය යනුවෙන් අරමුණු 3 ක් හඳුනාගෙන ඇත.<br>පූර්ණ කාලීන පාඨමාලාවන් 11 ක් පවත්වා ඔවුන්ගේ රුචිකත්වය සහ පළමු වසර අවසානයේ දී පවත්වනු ලබන විභාගයේ දී ඔවුන් ලබාගන්නා ලකුණු පදනම් කරගෙන ආධුනිකයින් තෝරාගනු ලැබේ.<br>අප ආයතනයේ පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන්ගේ දායකත්වය යටතේ සිදු කරනු ලබන සමාජ සුබසාධන වැඩසටහන් රාශියකි. අප ආයතනයේ පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන්ගේ දායකත්වය යටතේ සිදු කරනු ලබන සමාජ පුබසාධක වැඩසටහන් රාශියක්. අප ආයතනයට ආසන්න මොරටුව සොයිසාරාමයේ සිදුකරනු ලබන පිංකම් ආදිය සඳහා අවශ්‍ය සහභාගීත්වය මෙන්ම විහාරස්ථානයේ සිදු කරන සුද්ද පවිත්‍ර කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීමද අප ආයතනය මඟින් සිදු කරනු ලබයි. එසේම, ඕස්ට්‍රේලියානු ආදි ශිෂ්‍ය සංගමයේ දායකත්වය | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

ඇතිව ඉතා අඩු පහසුකම් සහිත ගම්මාන වල ජීවත්වන පවුල් සඳහා නිවාස හා රෝහල් ආදියද තනා පරිත්‍යාග කොට ඇත.

සෑම වසරකම ආයතනය මඟින් සියලු ආගමික උත්සව පවත්වනු ලබන අතර සෑම අංශයක්ම නියෝජනය වන පරිදි සතියකට එක් දිනක් උදෑසන 07.30 – 09.00 අතර කාලය තුල ක්‍රීඩා කිරීම සඳහා සෑම ආධුනිකයෙකුටම අවසර ලබා දී ඇත. මේ සඳහා මැනවින් නඩත්තු කරනු ලබන ක්‍රීඩා පිට්ටනියක් මෙන්ම කාය වර්ධන මධ්‍යස්ථානයක්ද අප සතුව පවතී.